සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

පාසල් වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

# 2023

## II පත්‍රය

නැණ ලොවට පා තබන හපනුන්ට මඟ කියන

## "අදිති"

පැය 01 විනාඩි 15

## පෙරහුරු විභාගය - 01

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

(01) පහත දැක්වෙන ඡේදය කියවන්න.

'ලාබයි ! ලාබයි ! නෝනා අලුත් එළවළු ගන්න.' වෙළෙන්දියක් කීවේ තාරුක දෙසත්, අම්මා දෙසත් බලමිණි. තොරතෝංචියක් නැතිව කෑගසමින් බඩු විකුණන අයගේ හඬින් තාරුකගේ සවන් පිරී ගියේ ය. මඳක් එපිටින් තබා තිබූ සෙල්ලම් බඩු දෙස තාරුක බලා සිටියේ ඒවාට වශී වූවකු ලෙසිනි. ජීවිතයේ පළමු වරට මෙම ස්ථානයට පැමිණි ඔහු එයින් විශාල ආස්වාදයක් ලබන බව ඔහුගේ ඉරියව් වලින් මවට හැඟුණි.

- ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.
  - i. ඡේදයෙන් කියවෙන්නේ කුමන ස්ථානයක් පිළිබඳව ද?

    ......................................................

  - ii. 'නොනවත්වා ම' යන අර්ථය දීමට ඡේදයේ යොදා ඇත්තේ කුමක් ද?

    ......................................................

  - iii. සෙල්ලම් බඩු දෙස තාරුක බලා සිටියේ කෙසේ ද?

    ......................................................

  - iv. 'කන්' යන්නට සමාන අර්ථයක් දැක්වෙන පදය ලියන්න.

    ......................................................

  - v. මෙම ස්ථානයේ දී තාරුක විශාල ලෙස ආස්වාදයක් ලබන බව, මවට හැඟුණේ කුමකින් ද?

    ......................................................

  - vi. ලාබයි ! මෙහි යෙදී ඇති විරාම ලකුණ කුමක්දැයි අකුරින් ලියන්න.

    ......................................................

(02) ප්‍රාණවාචී ඒකවචන අතීතකාල ක්‍රියා පදය තෝරා යටින් ඉරක් අඳින්න.

සග බැලූහ. සසග පෙනෙයි. සසසග දුන්නා ය.

(03) දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.

දත් / පුරුදු / දෙවරක් / මැදීමට / දිනපතා / දවසකට / වෙමු / අපි

..................................................................................................................

(04) පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත අඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් (√) ලකුණ ද, වැරදි නම් (x) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

i. කිරිල්ලී කූඩුවක් සාදයි. (..........)

ii. සේපාලිකා මල් බිම වැටුණේ ය. (..........)

iii. අම්මා උදෙන් ම අවදි වූහ. (..........)

iv. ඇත්තු ගං ඉවුරට පැමිණියෝ ය. (..........)

(05) ගැළපෙන විරාම ලකුණු යොදන්න.

| |
|---|
| මේ කවි පෙළෙහි පොත් කුරුල්ලා ලෙස හැඳින්වෙන්නේ කවරෙක් ද |

(06) දක්වා ඇති අදහස්වලට ගැළපෙන ඉඟි වැකි ලියන්න.

i. ඉතා ම කුඩා ප්‍රමාණයක් - ......................................................................................

ii. ඉටු නොවන සිහින මැවීම - ......................................................................................

(07) මෙම වැකි ලේඛන වහරට හරවා ලියන්න.

i. කුරුල්ලෝ කෑම සොයා ගියා.

......................................................................................................

ii. මම මුහුදු වෙරළ බලන්න ගියා.

......................................................................................................

(08) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය යටින් ඉරක් අඳින්න.

වලාකුළු / වළාකුළු

(09) යුගල පදය සම්පූර්ණ කරන්න.

කෙළි - ..................................................................

(10) ගැළපෙන පදය වරහන තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.


i. ස්ථාන නාම පදයකි. ( පිඟාන / මුහුද / කුරුල්ලා )

ii. ද්‍රව්‍ය නාම පදයකි. ( පාසල / රෙදි / ගුරුතුමී )

(11) එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන **සිංහල** වචනය ලියන්න.

i. Peacock - ...................................  ii. Broom - .........................................

(12) එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය **ඉංග්‍රීසි අකුරෙන් ම** ලියන්න.



i. .....................................



ii ...................................

(13) හිස්තැනට සුදුසු වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

i. I am .................................... ( eating / watering ) the plants.

ii. Where .................................. ( is / are ) you going ?

(14) ''இரண்டு மணி'' යන දෙමළ වචනය සඳහා යෙදෙන **සිංහල** වචනය ලියන්න.


..................................................................

(15) පහත වාක්‍ය දෙමළෙන් කියන ආකාරය **සිංහලෙන්** ලියන්න.

ඔබට වතුර ඕනද ?

..................................................................

(16) ' 5306 ' යන සංඛ්‍යාව ගණක රාමුවේ නිරූපණය කරන්න.




(17) පහත දී ඇති සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

i. හත්දහස් දහය - ...............................................................................

(18) පහත සංඛ්‍යාව අරෝහණ පිළිවෙලට ලියන්න.

i. 5084 , 6069, 5096 - ...........................................................................

(19) කොටුව තුළ ඇති සංඛ්‍යා සියල්ලම යොදා ගෙන පොදු අන්තරය 6 වන සංඛ්‍යා රටාවක් ගොඩනගන්න.

i. ...................., ...................., ....................

| | | |
|---|---|---|
| 1 | | 13 |
| | 7 | |
| 19 | | 25 |

(20) ලොතරැයි පත් අලෙවි කරන්නෙක් පළමු සතියේ දී ලොතරැයිපත් 1062 ක් ද, දෙවන සතියේ දී 985 ක් ද අලෙවි කළේ ය.


i. ඔහු සති දෙකේ ම අලෙවි කළ මුළු ලොතරැයි පත් සංඛ්‍යාව කීයද?

.................................................................................

ii. දෙවන සතියට වඩා පළමු සතියේ දී කොපමණ ලොතරැයිපත් සංඛ්‍යාවක් අලෙවි කර තිබේ ද?

.................................................................................

(21) ඉදිරියෙන් දී ඇති රූපයෙන් $\frac{2}{4}$ ක් (පැන්සලෙන්) පාට කරන්න.



(22) සමාන්‍ය ඔරලෝසුවේ ප.ව.4.25 ලෙස පෙන්වන වේලාව, පැය 24 ඔරලෝසුවේ දැක්වෙන ආකාරය ලියන්න.

.......................................................................

(23) 324, 3 න් බෙදූ විට පිළිතුර කීයද?

.......................................................................

(24) පහත බිල්පත සම්පූර්ණ කරන්න.

| **ද්‍රව්‍ය** | **මිල දී ගත් ප්‍රමාණය** | **කිලෝග්‍රෑම් එකක මිල** | | **වටිනාකම** | |
|---|---|---|---|---|---|
| | | රුපියල් | සත | රුපියල් | සත |
| සීනි | 3 | 105 | 00 | (i)................ | .................. |
| තේ කොළ | 250 | (ii) ............. | .................. | 237 | 50 |
| **මුළු මුදල** | | | | **552** | **50** |

(25) ලොකු භාජනයක පොල් තෙල් ලීටර් 12 මිලි ලීටර් 60 ක් ද, කුඩා භාජනයක පොල් තෙල් ලීටර් 9 මිලි ලීටර් 800 ක් ද ඇත. භාජන දෙකෙහි ඇති පොල් තෙල් ප්‍රමාණ අතර වෙනස කොපමණ ද?

ලීටර් .................................. මිලි ලීටර් .......................................


(26) තාත්තා ගෙනා බඩු මල්ලේ බර 5නට 475ට ද, අම්මා ගෙනා බඩු මල්ලේ බර 3නට 725ට ද වේ. බඩු මලු දෙකෙහි ම මුළු බර කොපමණ ද?

..............................නට ...............................ට

(27) වෙළෙන්දෙක් ළඟ තිබූ දොඩම් ගෙඩි ගණන 120 කි. එයින් $\frac{3}{4}$ ක දොඩම් ගෙඩි ප්‍රමාණයක් විකුණුවේ නම්, ඔහු ළඟ ඉතිරි දොඩම් ගෙඩි ගණන කීය ද?

......................................................................

(28) ළමයින් කණ්ඩායමක් වඩාත් කැමති පාට වර්ග පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයේ දැක්වේ.




i. කොළ පාටට කැමති ළමයි ගණන 9 කි. එය ප්‍රස්තාරයේ ඇඳ දක්වන්න.

ii. මෙම කණ්ඩායමේ සිටින මුළු ළමයින් සංඛ්‍යාව කීයද?

..........................................................................

- ප්‍රශ්න අංක 29 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර අතුරෙන් තෝරා **යටින් ඉරක් අඳින්න.**

(29) කාල නියමයක් ඇති ව මල් පිපෙන ශාකයකි,

i. කෙසෙල් ii. ඇහැළ iii. වද

(30) ශ්‍රී ලංකාවට පමණක් ආවේණික ශාකයකි,

i. නෙළුම් ii. ඕලු iii. කෙකටිය

(31) සතුන්ගෙන් ශාක වලට සිදු වන යහපතකි,

i. සතුන් ශාක වල කොටස් ආහාරයට ගැනීම.

ii. සතුන්ගේ පොහොර ශාක වර්ධනයට උදවු වීම.

iii. සතුන් ශාක උපයෝගී කරගෙන වාසස්ථාන සාදා ගැනීම.

(32) මල් පැණි ආහාරයට ගන්නා සතෙකි,

i. බට්ටිච්චා ii. පොල්කිච්චා iii. දෙමළිච්චා

(33) උරග කණ්ඩායමට පමණක් ඇතුළත් සතුන් වන්නේ,

i. කිඹුලා, කිරලා, ඉබ්බා ii. ලූලා, දියනයා, කලවැද්දා iii. කබරයා, ඉබ්බා, පිඹුරා

(34) මදුරුවාගෙන් බෝ විය හැකි රෝගයකි,

i. මහාමාරිය ii. ජලභීතිකාව iii. බරවා

(35) අපිරිසිදු ජලය පානය කිරීමෙන් ඇති විය හැකි රෝගයකි,

i. හෙපටයිටීස් ii. චිකන්ගුන්‍යා iii. මී උණ

(36) ප්‍රෝටීන් බහුල ව ඇති ශාකමය ආහාරයකි,

i. රටකජු ii. සෝයා බෝංචි iii. බිත්තර

(37) ආහාර කල් තබා ගත් පැරණි ක්‍රමයකි,

i. ශීත කිරීම ii. දුම් ගැස්සීම iii. පැකට් කිරීම

(38) ජල වාෂ්ප වලින් ලබා ගන්නා ප්‍රයෝජනයකි,

i. ආහාර සකස් කිරීම ii. විදුලිය නිපදවීම iii. ආහාර කල් තබා ගැනීම

(39) පිරිමි ක්‍රීඩකයින් පමණක් කරනු ලබන කණ්ඩායම් ක්‍රීඩාවකි,

i. වොලිබෝල් ii. නෙට්බෝල් iii. ෆුට්බෝල්

(40) ජාතික කොඩියේ ජාතීන් අතර එකමුතු බව නිරූපණය වන්නේ,

i. කොඩියේ ඇතුළේ බෝ කොළ සතරෙනි.

ii. කහ පැහැති සිංහ රූපයෙනි

iii. කොඩියම වට කර යෙදූ කහ පාට තීරුවෙනි.

(41) පහත ආහාර අතුරින් ශරීරය වර්ධනය වීමට අවශ්‍ය ආහාරය කුමක් ද?

i. ගොටුකොළ ii. මුං ඇට iii. ආප්ප

(42) ''මගේ සිතේ නිවීමෙන් ලැබෙන සැනසිල්ල මට දැනේ වා ! මගේ යහළුවන්ටත් දැනේ වා !'' යන්න අයත් වන්නේ සුවපත් වීමේ ක්‍රියාකාරකම් වල,

i. ප්‍රාර්ථනාවකට ය. ii. අධිෂ්ඨානයකට ය. iii. උද්‍යානයකට ය.

(43) ''කිණිහිරය'' රූපයක් මෙහි දැක්වේ එය පරිහරණය කරනු ලබන්නේ,



i. ගොවියා ය. ii. පෙදරේරුවා ය. iii. කම්මල්කරුවා ය.


(44) ශ්‍රී ලංකාවේ ඇති පළාත් තුනක් නිවැරදි ව දක්වා ඇති පිළිතුර වන්නේ,

i. වයඹ, බස්නාහිර, නැගෙනහිර

ii. උතුරු, නැගෙනහිර, ඊසාන

iii. බස්නාහිර, සබරගමු, ගිණිකොණ

(45) මේවා අතරින් **නොදැල්වෙන** බල්බය සහිත රූපය වන්නේ,



(46) දණ්ඩ චුම්බක දෙකක් කෙළවර එකිනෙක ළං කරන ලදී. එවිට චුම්බක දෙක එකිනෙක් ඈත් වීම දක්නට ලැබුණි. එසේ චුම්බක දෙක ළං කර තැබූ නිවැරදි ආකාරය දැක්වෙන රූපය කුමක් ද?

i. | S N | S N |

ii. | S N | N S |

iii. | S N | S N |

(47) ''අහසින් වැටෙන් එක ජල බිඳුවක් හෝ අපතේ නොයවා ප්‍රයෝජනයට ගත යුතු ය.'' යනුවෙන් ප්‍රකාශ කළේ,

i. දේවානම් පියතිස්ස රජතුමා ය.

ii. මහා පරාක්‍රමබාහු රජතුමා ය.

iii. දුටුගැමුණු රජතුමා ය.

(48) අතීතයේ පණිවිඩ යැවීම සඳහා යොදා ගත් පක්ෂීන් දෙදෙනෙකු වන්නේ,

i. කපුටන් හා කොවුලන් ii. හංසයින් හා තාරාවන් iii. පරෙවියන් හා හංසයින්

(49) රූපයේ දැක්වෙන ශ්‍රේෂ්ඨ පුද්ගලයා වන්නේ,



i. ආතර් සී ක්ලාක්

ii. ආනන්ද කුමාරස්වාමි

iii. ටි.බී. ජයා මැතිතුමා

(50) බෝග වගා කරන බිමක තිබිය යුතු ලක්ෂණයක් **නොවන්නේ,**

i. ජලය හොඳින් බැස යන බිමක් වීම.

ii. තද බෑවුම් සහිත බිමක් වීම.

iii. හොඳින් හිරු එළිය ලැබෙන බිමක් වීම.

(51) කඳුකර ප්‍රදේශ වල කැලෑ එළි කිරීම නිසා ඇති විය හැකි අයහපත් ප්‍රතිඵලයක් වන්නේ,

i. කඳු නායයාම ii. භූමිකම්පා ඇති වීම iii. නියඟ ඇති වීම

(52) ''තෙල් ගාලා හිස පිරන් නෑනෝ - ඇට වැල අරගෙන බැඳගන් නෑනෝ '' මෙය,

i. ගොයම් කවියකි ii. නෙළුම් කවියකි iii. කුලු නැටුම් කවියකි.

(53) ගලා යන ජලයේ ශක්තිය උදව් කරගන්නා අවස්ථාවකි,

i. ජල විදුලි නිපදවීම සඳහා

ii. කෘෂිකාර්මික කටයුතු සඳහා

iii. ධීවර කර්මාන්ත කටයුතු සඳහා

(54) තෙල් අධික ආහාර නිතර ආහාරයට ගැනිම නිසා ඇති විය හැකි රෝග තත්ත්වයකි.

i. දියවැඩියාව ii. හෘදරෝග iii. හෙපටයිටීස්

(55) මාර්ගයේ දී අනතුරක් ඇති වීමට වැඩි ඉඩකඩක් ඇත්තේ,

i. කහ හෝ සුදු ඉරි මඟින් පාර මාරු නොවීම නිසා ය.

ii. පාර මාරු වීමට උමං මාර්ග භාවිතා කිරීම නිසා ය.

iii. පදික වේදිකාවේ ගමන් කිරීම නිසා ය.

(56) කහ හා රතු වර්ණ මිශ්‍ර කිරීමෙන් සෑදෙන වර්ණය වන්නේ,

i. කොළ වර්ණය ii. රෝස වර්ණය iii. තැඹිලි වර්ණය

(57) 'චන්ද්‍රිකා උපයෝගී කරගෙන පණිවිඩ හුවමාරු කර ගත හැකි බව' මුලින් ම ප්‍රකාශ කළේ,

i. ආතර් සී ක්ලාක් මහතා

ii. ටී.බී ජයා මහතා

iii. ආනන්ද කුමාරස්වාමි මහතා ය.

(58) ''රෑ සහ දවල් '' ඇති වීමට බලපාන හේතුව වන්නේ,

i. පෘථිවිය ගෝලාකාර වීම යි.

ii. පෘථිවිය භ්‍රමණය වීම යි.

iii. සූර්යයා භ්‍රමණය වීම යි.

(59) ආහාර පිළියෙල කිරීමේ දී තම පිරිසිදු බව හා ආහාර වල පවිත්‍රතාවය ආරක්ෂා කිරීමට භාවිතා කරනු ලබන්නේ,

i. ඒප්‍රනය යි. ii. මුව ආවරණය යි. iii. අත් ආවරණය යි.

(60) 'මගේ චිත්‍රයට ප්‍රථම ස්ථානය ලැබුණු දා' යන්න මාතෘකාව කර ගනිමින් වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතු යි. ඒවායේ උක්ත අඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

1. ..........................................................................................

..........................................................................................

2. ..........................................................................................

..........................................................................................

3. ..........................................................................................

..........................................................................................